රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 32/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1989 මැයි මස 11 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් හා,
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

## 1980 ජූලි මස තනතුරු අත්හැර ගිය රාජ්‍ය නිලධාරීන්ට සහ සංස්ථා සේවකයන්ට සහන සැලසීම

පහත සඳහන් වන්නේ 1980 ජූලි මස තනතුරු අත්හැර ගිය නිලධාරීන් සම්බන්ධයෙන්, රජය විසින් ගනු ලැබ ඇති තීරණයන් වේ.

" 1. වර්ෂ 1980 ජූලි මාසයේදී සිය තනතුරු අත්හැර යන ලදුව, ඉක්බිතිව නැවත සේවයේ පිහිටුවනු නොලැබූ හෝ, සේවයෙන් විශ්‍රාම ගන්වනු නොලැබූ හෝ වෙනත් ආකාරයකින් සහන සලස්වනු නොලැබූ හෝ සියලුම සේවකයින්ට ඉතා වාසිදායක ප්‍රතිලාභ ලැබෙන්නට සලස්වනු ඇත. මෙම සියලුම සේවකයෝ මෙම අමාත්‍ය මණ්ඩල තීරණයට එළඹෙන ලද දින දක්වාම අඛණ්ඩව රැකියාවේ නියුක්තව සිටි අය ලෙස සලකනු ලබනවා ඇත. ඔවුන්ට හිමි සියලුම වැටුප් වර්ධක ගෙවා ඇත්තේය හා, 1980 ජූලි මාසයේ සිට මෙම අමාත්‍ය මණ්ඩල තීරණයට එළඹෙන ලද දිනය දක්වා කරන ලද සියලුම වැටුප් වැඩි කිරීම් ඔවුන්ට හිමි වී ඇත්තේය යන කල්පිත පදනමින් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ ගණන් බලනු ලැබේ. විශ්‍රාම වැටුප හා වෙනත් ප්‍රතිලාභ ගෙවීම පිණිස සේවකයාගේ සේවා කාලය ගණන් බැලීමේ කාර්යය සඳහා, විශ්‍රාම ගැනීම හෝ සේවා නියුක්තිය අවසන්වීම ක්‍රියාත්මක වන දිනය වශයෙන් සලකනුයේ මෙම අමාත්‍ය මණ්ඩල තීරණයට එළඹි දිනය හෝ අදාල නිලධාරියා 55 වන විය සම්පූර්ණ කළ දිනය ය.

2. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 366 ප්‍රකාර ලැබෙන්නට සලස්වන ලද විශ්‍රාම හා වෙනත් ප්‍රතිලාභ දැනටම ලබා ගෙන ඇති සේවකයින්ගේ විශ්‍රාමවැටුප්, පාරිතෝෂික හා වෙනත් ප්‍රතිලාභ ප්‍රතිශෝධනය කර ඉහත සඳහන් නියමයන්ට අනුකූල තත්ත්වයට පත් කරනු ඇත.

3. 1980 ජූලි මාසයේදී පරිවාස කාලයේ හෝ තාවකාලික සේවයෙහි සිටි රාජ්‍ය, පළාත් පාලන හා සංස්ථා අංශවල සේවකයින්ගේ විශ්‍රාම වැටුප් හා වෙනත් විශ්‍රාම ප්‍රතිලාභයන් ගණන් බැලිය යුත්තේ ඔවුන් මෙම අමාත්‍ය මණ්ඩල තීරණයේ දින දක්වා සේවයේ අඛණ්ඩව නියුක්තව සිටියවුන් ලෙස සලකමිනි.

4. මෙම ගණයට වැටෙන සේවකයින් රාජ්‍ය, පළාත් පාලන හා සංස්ථා ආයතනවලින් ලබාගෙන තිබෙන ණය මුදල් සඳහා වන පොලිය අයකිරීම අතහැර දමනු ලැබේ. එසේ වුවද, ඔවුන්ගෙන් අයවිය යුතු මුල් මුදල ඔවුන්ගේ විශ්‍රාම වැටුපෙන්, පාරිතෝෂිකයෙන් හෝ ඔවුන්ට අයවිය යුතු වෙනත් මුදලක් වේ නම් එයින් හෝ අයකර ගනු ලැබේ.

5. විශ්‍රාම ගැනීමට මනාපය පළකිරීමක් නොකර හෝ පාරිතෝෂිකයක් හෝ වෙනත් ප්‍රතිලාභ කිසිවක් නොලබා හෝ මරණයට පත්ව ඇති යම් සේවකයෙක් හෝ සේවිකාවක් වේ නම් ඔහුගේ හෝ ඇයගේ බිරිඳට හෝ ස්වාමි පුරුෂයාට හෝ වෙනත් යැපෙන්නෙකුට හෝ, ඔහුගේ නැත්නම් ඇයගේ විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හෝ වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම ලැබේ. ,මෙම ප්‍රතිලාභ ගණන් බලනුයේ මරණයට පත් තැනැත්තා හෝ තැනැත්තිය අමාත්‍ය මණ්ඩලය මෙම තීරණයට එළඹෙන ලද දින දක්වා හෝ ඔහු හෝ ඇය 55 වන විය සම්පූර්ණ කරන දින දක්වා හෝ සේවයේ නියුක්තව සිටියා සේ සලකමිනි.

6. ඉහත සඳහන් නියමයන් යටතේ විශ්‍රාම ගොස් ඇත්තා සේ සලකනු ලබන සියළුම සේවකයින්ට ඔවුන්ගේ වයස, පළපුරුද්ද, සුදුසුකම්, කාර්යක්ෂමතාව යන කරුණු අනුව නැවත සේවයේ යොදවනු ලැබීමටද, සුදුසුකම් ලැබේ. මේ අනුව ඔවුන්ට රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක නැවත සේවයේ යොදවනු ලැබීම සඳහා සලකා බලනු ලැබීමට අවස්ථාව ලබාගැනීමට හැකිවනු ඇත. එනමුත් එසේ නැවත සේවයේ යෙදවීම සඳහා ඉදිරිපත් කෙරෙන සියළුම අයදුම්පත් විශ්‍රාමික රජයේ සේවකයන් නැවත සේවයේ යෙදවීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ලේකම් අනුකමිටුවේ අනුමැතිය සඳහා අදාල අමාත්‍යාංශය විසින් නිර්දේශ කරනු ලැබිය යුතුය.

7. 1980 ජුලි මස සිට නැවත සේවයෙහි යොදවනු ලැබ සිටින රාජ්‍ය, පළාත් පාලන හා සංස්ථා අංශවල සේවකයින්ට නොයෙක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් පනවා ඇති සියළුම සීමාවන් අවලංගු කරනු ලැබේ.

8. 1980 ජුලි මාසයේ පිය තනතුරු අතහැර ගිය පෞද්ගලික අංශයේ සේවකයින්ටද රාජ්‍ය අංශයේ සේවකයින් සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය අනුව සහන සලසන ලෙස කම්කරු අමාත්‍යාංශය පෞද්ගලික අංශයේ සියළුම හාම්පුතුන්ගෙන් ද ඉල්ලා සිටිනු ඇත. ",

11. තනතුරු අතහැර ගිය නිලධාරීන් පිළිබඳව නිශ්චිත තොරතුරු රැස්කිරීම අවශ්‍ය වී තිබේ. මේ සම්බන්ධව පළ කරනු ලැබ ඇති පුවත්පත් නිවේදනයක පිටපතක් ද සියළුම ප්‍රාදේශීය උප දිසාපතිවරුන් වෙත යවනු ලැබ ඇති චක්‍රලේඛයක පිටපතක් ද ඔබගේ දැන ගැනීම සඳහා මෙයට යා කර ඇත. ප්‍රාදේශීය උප දිසාපතිවරුන් මාර්ගයෙන් ලැබෙන්නට සලස්වා ඇති සහන ආකෘති පත්‍රවලට අමතරව ඔබ කාර්යාලයේද තනතුරු අතහැර ගිය නිලධාරීන්ට ලැබීමට සැලැස්වීම පිණිස ආකෘති පත්‍ර කට්ටලයක් මේ සමඟ ඔබවෙත එවමි.

( සිරිල් ගමගේ )
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.